# ඒෂියන් ග්‍රැමර් පාසල
## පළමු වාර පරීක්ෂණය - 2019
## 08- ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 1/2 යි

නම:--------------------------- පන්තිය: -------------------------

සැකසුම : නිශාන්ති වීරසිංහ

---

### I කොටස

පළමු කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

ඉරි ඇඳි කොටසට වඩාත්ම ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න

01. අසල් වැසියන් තම දියුණුවට <u>අකුල් හෙලනවා</u> යි සිතූ ධනංජය පදිංචිය හැර ගියේය.

    I. පහර ගසනවා II. බාධා කරනවා

    III. ඊර්ෂ්‍යා කරනවා IV. උපකාර කරනවා

02. රිය අනතුරකට මූලික වූ රියදුරා අල්ලා ගත් ගම්මු <u>අත් වල හිරි ඇර ගත්හ.</u>

    I. අත් කර කැවුහ. II. පහර දුන්හ.

    III. ලැජ්ජාවට පත් කලහ. IV. හිරි වැටුණු අත් සෝදා ගත්හ.

03. නිවැරදි අක්ෂර වින්‍යාසයට රීති ඇතුළත් පිළිතුර තෝරන්න

    I. ළමයා, කපුයා, පරීක්ෂණය

    II. ලමයා, කපුටා, පරීක්ශණය

    III.ළමයා, කපුටා, පරීක්ෂණය

    IV. ලමයා, කපුටා, පරික්සනය

04. මහාප්‍රාණ අක්ෂර දෙකක් ඇතුළත් වචනය තෝරන්න.

    I. අධිෂ්ඨානය II. සර්ෂණය III. නිෂ්පාදනය IV. නිර්මළ

05. මහාප්‍රාණ අක්ෂර ගණන කීයද?

    I. 10 II. 15 III. 05 IV. 08

06. වර්ග අක්ෂර ගණන කීයද?

    I. 15 II. 20 III. 25 IV. 05

07. සඤ්ඤක අක්ෂර පමණක් ඇති වචන යුගලය

I. දඬු - ගඟ II. සංයුක්තය - පරිමාව

III. අඬ- දඹර IV. ගණ - උණ

08. පහත සඳහන් යුගල පද අතරින් මුල් පදයට විරුද්ධ අර්ථයක් දෙන පිළිතුර තෝරන්න

I. අඹු - මුලු II. මුදල් - හදල්

III. සැප - සනීප IV. අම්මා - තාත්තා

.09. "නුවන" සමාන අර්ථයක් නොදෙන පදය කුමක්ද?

I. ලෝචන II. චුවන

III. නයන IV. ඇස

10. පර්යාය පද පමණක් ඇති පේළිය තෝරන්න.

I. නුවන, ලෝචන, නයන

II. නුවණ, ඇස, ලෝචන

III.ගුවන අඹර, මිහිකත

IV. දෙරණ, ගඟ, වත

11. උත්තම පුරුෂ බහුවචන නාම පදයකි

I. මුල II. මුළ III. කැළ IV. පෙළ

12. "මස් පමණක් ආහාරයට ගන්නා" වාක්‍යයට තනි පදයකි?

I. නුඹලා II. කුරුල්ලෝ III. අපි IV. මෙතෙම

13. අනුක්ත පදයකි

I. අපි II. ඔවුන් III. මම IV. ළමයි

14. පහත සඳහන් එක් එක් වාක්‍යකට සුදුසු පදය තෝරන්න. ලියා තැබීමකින් තොරව මුඛ පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආ සාහිත්‍ය නිර්මාණය ------------ වේ.

I. නාට්‍යය II. ජන කවිය

III. නවකතාව IV. චිත්‍රපටිය

15. කුත්වැසි නුවණ යනුවෙන් හඳුනවන්නේ -------------

I. විචක්ෂණ බව II. තණකොළ වර්ගයකි

III. තැනට සුදුසු නුවණ IV. ගිය නුවණ

16 විජය රජ්ජුරුවන්වෝ පැමිණියේ ------------- රටේ සිටය.

I. වංග II. පාකිස්තානයයේ

III. බුරුමයයේ IV. මාල දිවයිනනේ

17. බඩ පිස්සා යනුවෙන් හඳුන්වන්නේ -------------

I. බාලයා II. මද්දුමයා III. වැඩිමලා IV. සියල්ලම

18. සිරිපා වඳින්නට මුල්වරට යන තැනැත්තා ------------- නම් වේ.

I. කෝඩු II. කිරි කෝඩුකාරයා III. මුලාදෑනියා IV. කිරිකිත්තා

20. රාත්‍රි කවි පන්තිය ----------------- නිර්මාණයකි.

I. කේයස් ගේ. II. කුමාරතුංග මුනිදාස ගේ

III. එස් මහින්ද හිමි ගේ IV. රඹුක්කන සිද්දාර්ථ හිමි ගේ

20. සමාන පදයක් නොවන්නේ ---------------------

I. වත II.සිරුර III. ගත IV. ශාරීරය

(ලකුණු 40)

## II කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් මාතෘකාවලින් වචන 100 කට වැඩි රචනාවක් ලියන්න.

I. රාත්‍රියක සුන්දරත්වය.

II. සිංහල අවුරුදු දා

III. නිශ්ඵල කටයුත්ම නිරත වීම ආතෝපදේශයක් ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 10)

02. රුවන්, සුනිල්, හා අජිත් දිවයිනේ දිසා තුනක වෙසෙනෙ මිතුරන් තිදෙනෙකි. රුවන් මහනුවර, කුණ්ඩසාලය, අසල ගමක පවුලකට අයත්ය. සුනිල්ගේ මා පියන් බස්නාහිර පළාතේය. අජිත්ගේ පදිංචිය දකුණු පළාතය. ඔවුන් තිදෙනාගේම මිතුරුකම ලියැවුණේ සතියකට වරක් පළවන සඟරාවක් මාර්ගයෙනි. එම කලා සඟරාවට ඉඳහිට රචනා ලියූ සුනිල් පිළිබඳ විස්තරයක් දිනක් සඟරාවේ පළ විය. දිවයිනේ විවිධ පෙදෙසේවල මිතුරන් ඇසුරු කිරීමටය තමා කැමැත්තෙන් සිටින බව සුනිල් තමා පිළිබඳ විස්තරයේ සඳහන් කර තිබුණි.

පැනේ මිතුරුකම අරඹන විට මේ තිදෙනාම සිටියේ අ.පො.ස (සා. පෙ) විභාගයට පෙනී සිටීමට ආසන්නවය. පසුව තුන් යාළුවෝ එම විභාගයෙන් සතුටුදායක ලෙස සමත් වූහ. විභාගයෙන් පසු කොළඹ දී හඳුනා ගන්නා තුරු ඔවුන් එකිනෙකා පෞද්ගලික හමු වී තිබුණේ නැත.

(තුන් යහළු වික්‍රමය- කුලසේන පොන්සේකා)

I. මෙහි සඳහන් තුන් යහළුවන් නම් කරන්න.

II. ඔවුන් ජීවත් වූ පලාත් 03 නම් කරන්න.

III. ලිපි ලිවීම් තුළින් හඳුනා ගන්නා යහළුවන් හඳුන්වන නම කුමක්ද?

IV. ලේඛකයා හා කෘතිය නම් කරන්න.

V. මුල්ම හමු වීම සිදු වුයේ කොහේද? (ලකුණු 10)

03. මාන්දම නිසා බේරුණා බඩ ගෙඩිය

පණුවන් පිරීලා ඔහුටම බර වැඩිය.

පනාවක් නොදුටු කොලුවගෙ ඔළු ගෙඩිය

කඩි ගුලකටත් වැඩියෙන් නලියන තඩිය (කේයස්)

I. මෙම කොලුවට සැදී තිබුණා අසනීපය කුමක්ද?

II. පණුවන් පිරීතිබුණේ කොහේද?

III. කවියාගේ නම කුමක්ද?

IV. කඩි ගුලකට උපමා කර ඇත්තේ කුමක්ද?

V. මෙහි සඳහන් කොලුවා කුමන ආර්ථික මට්ටමකට අයත් අයෙක්ද? (ලකුණු 10)

04. පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න

I. "මේ ඇවිල්ලා තියෙන්නේ නැති වූ දෙයක් ගැන අහන්නයි"

01. කවුරුන් විසින් කා හට කියන ලද්දක්ද? ------------------
02. නැති වී තිබුණේ කුමක්ද? ------------------
03. පාඩමේ නම කුමක්ද? ------------------ (ලකුණු 04)

II. "බෙංගාලි මහා කවියා"

01. මේ නමින් හැඳින් වූයේ කවුරුන්ද? ------------------
02. ඔහුට එම අන්වර්ථ නම ලැබීමට මුල් වූ හේතුව කුමක්ද?------------------
03. නොබෙල් ත්‍යාගය පිරි නමන රට ක කුමක්ද? ------------------ (ලකුණු 03)

III. "සීයේ මෙම ලිපේ තියෙන නානු කියන්නේ කමොනවාද?"

01. පාඩම කුමන්ද? ------------------
02. නානු සැකසීමට ගන්නා ඖෂධ වර්ග ලියන්න ----------------- -----------------

----------------- ----------------- ----------------- ----------------- -----------------

03. මිනිසාට විශ්‍රාම අවශ්‍ය යැයි හැඟීම ඇති වූ අවුරුදු චාරිත්‍රය කුමක්ද? -----------------

05. මෙම පද වල තේරුම ලියන්න

I. පුරාණෝත්සවය - ------------------
II. ජන්මෝත්සවය - ------------------
III. නොනගතය - ------------------
IV. කාට ගාය - ------------------
V. තැනේ හැටියට ඇණේ - ------------------ (ලකුණු 05)

06. ඉතිරි කවි පද පුරවන්න

එළි බහින්නෙ නෑ දවල් ට
හැම වැඩක්ම රැ රැ ට
--------------------------------------
--------------------------------------
වට්ටි පෙට්ටි හැම එකක් ම
--------------------------------------

කොහෙන් ඉගෙන ගත්තද ඔබ
-------------------------------------- (ලකුණු 05)

හිස්තැන් පුරවන්න.

| <u>**ස්ත්‍රී**</u> | <u>**පුරුෂ**</u> |
| --- | --- |
| කෙනෙර | ---------------------- |
| ------------------ | නයා |
| බිසව | ------------------------ |
| ------------------ | මාළුවා |
| නංගි | ---------------------- |

(ලකුණු 05)

අතීත කාලයට හරවන්න.

01. නංගි මල් කඩයි.
02. වෙළෙන්දා බඩු විකුණයි.
03. සිටු දියණියෝ දිය කෙළියේ යෙදෙති.
04. ගස් සුළඟට සෙලෙවෙයි.
05. උපාසකයෝ පන්සිල් රකිති.

(ලකුණු 05)

(ලකුණු 10)